# සමකාලීන සමාජ ප්‍රගමනය උදෙසා පැරැන්නන්ගේ සහානුභූති සංකල්පයේ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (රජරට සභ්‍යත්වය ඇසුරෙන්)

**ඒකනායක එච්.එම්.එන්.එම්.**[1]

පුරාතන ලංකාවේ මානව සමාජය තුළ ද සහකම්පනයෙන් යුතුව කටයුතු කළ අවස්ථා ගණනාවක් දක්නට ලැබේ. රජරට සභ්‍යත්ව අවධියේ දී සහානුභූති සංකල්පයට හිමි වූ කාලීන වැදගත්කම හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. සමකාලීන සමාජ ප්‍රගමනය උදෙසා සහානුභූති සංකල්පය මඟින් සිදු කළ බලපෑම කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය අධ්‍යයනය, අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් භාවිත කරන ලදී. අතීත සමාජ ප්‍රගමනයට බෙහෙවින් හේතු වූයේ බුදු දහමින් ලත් ආභාෂය යි. පැරැන්නන් ඉදිරියට ආ ක්‍රමානුකූල ගමන් මඟ තුළ එකිනෙකා අතර සහෘදත්වයෙන් සංවේදී ව කටයුතු කළ ස්වභාවයක් දක්වා තිබේ. ආගම හා බැඳුණු දේශපාලන යාන්ත්‍රණය තුළ ඉහළ ම ස්ථානය දැරූ රජු විසින් තම පරිපාලන කටයුතු පවත්වා ගනිමින් සාමාන්‍යය ජනයා දක්වා සහකම්පනයෙන් යුක්ත ව තම වගකීම් ඉටු කරන ලදී. අන්‍යෝන්‍යය සබඳතාවයෙන් එකිනෙකාට ගෞරව සම්ප්‍රයුක්ත ව සහ පරිසර සංවේදීතාවයෙන් යුතු ව වරින්වර පැමිණෙන අභියෝගවලට සංවිධානාත්මක ව මුහුණ දෙන ආකාරයක් දැකිය හැකි ය. දුටුගැමුණු රජතුමා එළාර රජු වෙනුවෙන් ස්තූපයක් කරවා ඊට ගෞරව දක්වන ලෙස ප්‍රකාශ කළ බව මහාවංශයේ සඳහන් වේ. සතුරා දෙස වුව ද ගෞරවයෙන් සානුකම්පිත ව කටයුතු කර තිබේ. බුද්ධදාස රජු විසින් මිනිසුන්ට මෙන් ම සතුන් කෙරෙහි ද සානුකම්පිත වූ බව වංශකතාවේ සඳහන් වේ. තිරසර සංවර්ධනය අනුව යමින් පරිසරය සුරක්ෂිත කිරීමට පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති පාලකයන් විසින් අනුගමනය කරන ලදී. මෙසේ රටවැසියා අතරත් ඉන් ඔබ්බට ගොස් අනන්‍යයන් කෙරෙහිත් සතුන් හා පරිසරය කෙරෙහිත් මානුෂිකත්වයෙන් කටයුතු කිරීමට පෙළඹී ඇති බව හඳුනාගත හැකි ය. එම උතුම් ගුණාංගය සහානුභූති සංකල්පය හෙවත් සහකම්පනය යි. රාජ්‍ය සංවර්ධනයේ දී සුවිශේෂී බලපෑමක් සිදු කරන ලද මෙම සංවේදීතා මානවයා අතර ගොඩනංවාලීමේ දී රාජකීයයන් විසින් සිය රාජ්‍ය ප්‍රතිපත්ති ඒ සම්බන්ධයෙන් ගොඩනඟමින් නීතියක් දක්වා ගෙන එන ස්වභාවයක් අතීතය තුළ විද්‍යාමාන වී තිබේ. හෝපිටිගමුව, වේවැල්කැටිය ආදී අභිලේඛන මඟින් ගෙන ගිය නීතිමය ප්‍රතිපත්ති නීති රැකීමට කළ ඉල්ලීමක් මිස අණදීමක් නො වේ. රජරට සභ්‍යත්ව අවධියේ දී පැරැන්නන් තුළ වූ සහානුභූති සංකල්පය කාලීන ව පැවති ගැටලු හා අභියෝගවලට විසඳුම් සෙවීම සඳහාත් සමාජ ප්‍රගමනය උදෙසාත් ප්‍රබල බලපෑමක් ඇති වන්නට ඇති බව මෙමඟින් හඳුනා ගත හැකි ය.

**මුඛ්‍ය පද :** පැරැන්නන්, තිරසර, සමාජ, සහකම්පනය, සහානුභූතිය

[1]මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. nimeshaekanayake65@gmail.com